# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර) - 2011/2012**
**2014 අප්‍රේල්/ මැයි/ ජූනි**

**සමාජීය විද්‍යා පීඨය**

**ජනසන්නිවේදනය - MACO - E 3025**

**නිර්මාණාත්මක සන්නිවේදනය හා විචාර අධ්‍යයනය**

**පුශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03**

---

01. "මානවයාගේ සමාජ පැවැත්ම ආරක්ෂා කිරීම හා කළමනාකරණයෙහි ලා නිර්මාණාත්මක සන්නිවේදනය මහෝපකාරී වේ." නිර්මාණාත්මක සන්නිවේදනයේ මූලිකාංග ඇසුරින් පහදන්න.

02. "නිර්මාණකරණය හා සංස්කෘතිය අතර ඇත්තේ අවියෝජනීය බැඳීමකි" අන්තර් සංස්කෘතික අධ්‍යයනයේ වැදගත්කම ඇසුරින් පැහැදිලි කරන්න.

03. "ජන විඥානය හඳුනා ගැනීමෙන් තොරව විවිධ දේශපාලන, අලෙවිකරණය හා සංස්කෘතික මතවාද ප්‍රවර්ධනය කළ නොහැකිය." නිදසුන් ඇසුරින් සාකච්ඡා කරන්න.

04. "සාහිත්‍ය යනු ප්‍රබල ප්‍රකාශන මාධ්‍යයකි." සම්භාව්‍ය සාහිත්‍යයේ නිර්මාණශීලී ශක්‍යතා ඇසුරින් පැහැදිලි කරන්න.

05. "ජනශ්‍රැතියෙන් පුද්ගලයාගේ පැවැත්මට අදාළ ආචාරධර්මීය හා මනෝවිද්‍යාත්මක ලක්ෂණ පිළිබඳව විවරණය වේ." නිදසුන් ඇසුරින් පහදන්න.

06. "නිර්මාණකරුවාගේ සහ සහෘදයාගේ අභිමතාර්ථ සඵල කරගැනීමෙහි ලා විචාරකයාගේ භූමිකාව වැදගත් වේ." සාකච්ඡා කරන්න.

07. මාධ්‍ය විශ්ලේෂණ ක්‍රම හඳුන්වා සංඥාර්ථවේදය ඇසුරින් ඔබ කැමති නිර්මාණාංගයක අන්තර්ගතය විචාරයට ලක් කරන්න.

08. පහත සඳහන් මාතෘකා අතරින් **හතරක් 04 ක්** පිළිබඳ කෙටි සටහන් ලියන්න.
    - i. නිර්මාණය යනු කුමක්ද?
    - ii. ගීතයේ නිර්මාණශීලීත්වය
    - iii. නිර්මාණය හා භාෂාව
    - iv. පුරහඳ කළුවර චිත්‍රපටය
    - v මහගමසේකර හා නිර්මාණකරණය

****************************